සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development

සමාජ සවිබලගැන්වීම්, සුබසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශය
சமூக வலுவூட்டல் நலன்புரி மற்றும் கண்டி மரபுரிமைகள் அமைச்சு
MINISTRY OF SOCIAL EMPOWERMENT, WELFARE AND KANDYAN HERITAGE


මගේ අංකය / எனது இல / My No: DSD/HO/6/EP/06/2018/ක්‍රි.සැ.

ඔබේ අංකය / உமது இல / Your No: ..........................................

දිනය / திகதி / Date: 2018.03.29

***සමෘද්ධි චක්‍රලේඛ අංක 2018/ 02***

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්/ දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂවරුන්/ සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන් වෙත.

**ව්‍යවසාය සංවර්ධන වැඩසටහන 2018 - ව්‍යවසායකයින් 14,021ක් සංවර්ධනය හා නව ව්‍යවසායකයින් 14,021ක් අළුතින් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය ( ග්‍රාම සේවා වසමකට දෙදෙනෙකු බැගින්)**

තිරසර යුගයක් ජාතික ප්‍රතිපත්තියට අනුව ජාතික මට්ටමේ ඉලක්ක සපුරා ගැනිමේදී සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවට පැවරි ඇති ප්‍රධාන වගකීම වන්නේ දිළිදුකම පිටුදැකිම වෙනුවෙන් ක්‍රමවත් වැඩපිළිවෙලක් සකස් කොට සමෘද්ධි සහනාධාරලාභි පවුල් 125,000ක් වාර්ෂිකව ඉහල ආදායම් ලබන පවුල් බවට පත් කිරීමයි.

අප රටේ රැකියා ප්‍රශ්නය විසදීමට මෙන්ම දුගී ජනතාව දුගී බවෙන් මුදවා ගැනිමට ඇති ඉතාම ප්‍රායෝගික ක්‍රමවේදය <u>ව්‍යවසාය සංවර්ධනය</u> වන බැවින් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් මේ දක්වා ක්‍රියාත්මක වු අලෙවි සංවර්ධන අංශය, සුළු හා කුඩා පරිමාණ ව්‍යවසාය සංවර්ධනය ඉලක්ක කරගෙන ව්‍යවසාය සංවර්ධන අංශය ලෙස ක්‍රියාත්මක කිරීමට තීරණය කර ඇත.

ඒ අනුව ප්‍රධාන වැඩසටහන් 3 ක් යටතේ සමෘද්ධි හා අඩු ආදායම්ලාභින්ගේ ව්‍යවසායක සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

1. ව්‍යවසායකත්ව සංවර්ධනය සඳහා ග්‍රාම සේවා වසමකට එක් අයෙකු බැගින් පුහුණුකරුවන් බිහිකළ හැකි සම්පත් දායකයින් (TOTS) සංවර්ධනය.
2. සුළු හා කුඩා පරිමාණ ව්‍යවසායකයින් 14,021 ක් ප්‍රවර්ධනය කිරිම.
3. නව ව්‍යවසායකයින් 14,021ක් ග්‍රාම සේවා වසමකට එක් අයෙකු බැගින් පුහුණු කිරිම හා ව්‍යාපාර ආරම්භ කිරිම සඳහා පෙළඹවීම.


1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaram

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අධ්‍යක්ෂ (මානව සම්පත්) / பணிப்பாளர் ( மனிதவளம்) / Director (Human Resource) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මුල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2871672/2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | Hot Line:0112-885582 | Hot Line: 011- 288 |
| | | Hot Line :0112-889007 | | | |

01. ව්‍යවසායකත්ව සංවර්ධනය සඳහා සුදුසු පුහුණුකරුවන් බිහිකළ හැකි සම්පත් දායකයින් (TOTS) සංවර්ධනය

සුළු හා කුඩා පරිමාණ ව්‍යාපාරික ක්ෂේත්‍රය පිළිබද අවධානය යොමු කිරිමේදී ව්‍යවසාය සංවර්ධන විෂය පිළිබද පුහුණුව හා දැනුම ඇති පුහුණුකරුවන්ගේ/ සම්පත්දායකයින්ගේඅවශ්‍යතාවක් ඇත. එකී අවශ්‍යතාව සපුරාලීම සදහා පුහුණුකරුවන් 500 ක් හා ව්‍යවසාය සංවර්ධනය පිළිබද උපදේශකවරුන් 1074 ක් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව තුළ බිහිකිරීමට කටයුතු සැලසුම් කර ඇත. පුහුණුකරුවන් ( TOT ) 500ක් පුහුණු කිරීමමානව සම්පත් අංශය මගින් සිදු කිරීමට දැනටමත් කටයුතු කර ඇති අතර උපදේශකවරුන් ලෙස කටයුතු කිරීමට කැමැත්ත දක්වන පහත සදහන් හැකියාවන් හා කුසලතාවය ඇති සමෘද්ධි කළමනාකරුවන්ට හා සංවර්ධන නිලධාරීන්ට ඒ සදහා ඉදිරිපත් විය හැකි වේ. මේ සදහා ඔබ දිස්ත්‍රික්කයේ පහත දැක්වෙන සුදුසුකම් සහිත නිලධාරින්ගේ නාමලේඛනය ව්‍යවසාය සංවර්ධන අංශයට 2018 ජුනි මාසයට පෙර ලබාදිය යුතුය.

1. පුහුණුකරුවකු ලෙස කටයුතු කිරීමට හැකියාව තිබීම
2. ව්‍යාපාරික කේෂ්ත්‍රය පිළිබද අත්දැකීම් ලබා තිබීම
3. ව්‍යාපාර උපදේශන විෂය පිළිබද කැමැත්ත උනන්දුව, දක්ෂතාවය මෙන්මඅත්දැකීම් ලබා තිබීම
4. වෙනත් විශේෂ කුසලතා

   ඒ අනුව මේ සදහා ඉදිරිපත් වන නිලධාරින් NEDA, SIYB, YOU-LEAD යන ආයතනවල සම්පත්දායකත්වයෙන් 2018 අගෝස්තු 31 දිනට පෙර පුහුණු කිරිම් අවසන් කර එම අයගේ සේවය සමෘද්ධි ව්‍යවසායකයින්ට ලබාදීමට අපේක්ෂා කෙරේ.

02. සුළු හා කුඩා පරිමාණ ව්‍යවසායකයින් 14,021 ක් ප්‍රවර්ධනය කිරීම

මෙම වසර තුළ සමෘද්ධි ව්‍යවසායකයින් 14021 ක් සවිබල ගැන්විම ඉලක්ක කර ඇති බැවින් දැනටමත් කිසියම් ව්‍යාපෘතියක් ආරම්භ කර පවත්වාගෙන යන ව්‍යවසායකයින් හදුනා ගෙන ඔවුන්ගේ ව්‍යාපෘති චිරස්ථායිව පවත්වා ගෙන යෑමට අවශ්‍යපහත වැඩසටහන් ක්‍රියාත්මක කිරිමට අපේක්ෂිතය.

2.1 ඔවුන්ගේ ගැටළු මනාව හඳුනාගැනීම හා විශ්ලේෂණය කිරීම

2.2 ව්‍යාපෘති සඳහායටිතල පහසුකම් ප්‍රවර්ධනය

2.3 අලෙවි අවස්ථා පුළුල් කිරීම

2.4 විශේෂ වැඩසටහන්

2.5 ප්‍රගති සමාලෝචනය

2.1 ගැටළු හඳුනාගැනීම හා විශ්ලේෂණය කිරීම

### 2.1.1. සමෘද්ධි ව්‍යවසායක ජාතික සම්මේලනය

2016 හා 2017 වසර වල ලබාදුන් උපදෙස් පරිදි මේ වනවිට ප්‍රාදේශිය ව්‍යවසායක සංගම් හා දිස්ත්‍රික් ව්‍යවසායක සංගම් පිහිටුවිමේ කටයුතු අවසන් කර ඇති අතර දිවයින පුරා පිහිටුවා ඇති ව්‍යවසායක සංගම් ගණන 351 ක් පමණ වේ.

මෙම සංගම් පිහිටුවිමේ ප්‍රධාන අරමුණ වූයේ අඩු ආදායම්ලාභීන් ලෙස සමෘද්ධි වැඩසටහන හා ක්‍රියාකාරිව සම්බන්ධ වෙමින් හා එහි ප්‍රතිලාභ ලබමින් තම ජීවනෝපාය ලෙස ව්‍යපාරවල යෙදෙන ව්‍යපාරිකයින්/ ව්‍යවසායකයින් ආර්ථික, සමාජීය හා දේශපාලනමය වශයෙන් තිරසාර ලෙස සවිබල ගන්වා ජාතික තලයට හඳුන්වා දීමයි. එහි එක් අදියරක් ලෙස සමෘද්ධි ව්‍යවසායක ජාතික සම්මේලනය මෙම වසරේ ජුනි මාසය තුළ කොළඹදි පැවැත්විමට සැලසුම් කර ඇත. ඒ සදහා

- ප්‍රාදේශිය ව්‍යවසායක සංගම් සභාපති - 331
- දිස්ත්‍රික් ව්‍යවසායක සංගම් සභාපති - 25
- ජාතික මට්ටමේ ප්‍රධාන පෙලේ ව්‍යාපාරිකයින්
- ව්‍යාපාර හා ව්‍යවසායක ක්ෂේත්‍රයේ සම්පත්දායකයින් හා විද්වතුන් හා
- රාජ්‍ය ආයතන නියෝජිතයින්ගේ සහභාගිත්වයෙන් පැවැත්විමට සැලසුම් කර ඇත. ඒ සදහා ව්‍යවසායක සංගම් සාමාජිකයින් සහභාගි කරවීමට පෙර සුදානමක් හා දැණුවත් කිරීමක් සිදු කළ යුතු බව අවධාරණය කරමි.

### 2.1.2.සමෘද්ධි ව්‍යවසායක සමීක්ෂණය

සමෘද්ධි වැඩසටහන සමඟ ක්‍රියාකාරීව සම්බන්ධ වෙමින් එහි ප්‍රතිලාභ ලබමින් තම ජීවනෝපාය ලෙස ව්‍යාපාරවල යෙදෙන සාර්ථක ව්‍යවසායකයින් මෙන්ම ව්‍යාපාර කටයුතු අසාර්ථක වූ ව්‍යවසායකයන් පිළිබඳව තොරතුරු රැස් කිරීමට සැලසුම් කර ඇත. සමෘද්ධි වැඩසටහන ආරම්භයේ සිට බිහිවූ ව්‍යවසායකයින් විශාල පිරිසක් දිවයින පුරා විසිරි සිටින අතර ඉන් 30,000කට අධික සමෘද්ධි ව්‍යවසායකයින් පිරිසක් මෙම සමීක්ෂණයට භාජනය කිරීමට අපේක්ෂිතය. ඊට අදාල තොරතුරු රැස් කිරීම සහ දත්ත පරිගණක ගත කිරීමට අදාල උපදෙස් හා මඟ පෙන්වීම **"ව්‍යවසාය සංවර්ධන අංශය"** මගින් ඉදිරියේදී ඔබවෙත ලබාදීමට කටයුතු සලසා ඇත.

### 2.1.3 පුහුණුව තුළින් ව්‍යවසාය කළමණාකරණ දැණුම/කුසලතා වර්ධනය කිරීම

සුළු හා කුඩා ව්‍යාපාරවල නියුක්ත ව්‍යවසායකයින් හා ඔවුන් ගේ පවුල් හඳුනාගෙන ඔවුන් සමජාතිය කණ්ඩායම් ලෙස සංවිධානගත කිරීම, ඔවුන්ගේ ගැටළු නිවැරදිව හඳුනාගැනිම හා එම ගැටළු විසදාගත හැකි ආකාරයට ඔවුන්ට පුහුණුව හා විසදුම් ලබාදිම මේ යටතේ සිදු කළ යුතු අතර ව්‍යවසාය උපදේශකයින් ලෙස පුහුණුව ලද පුහුණුකරුවන්ගේ සේවාව මෙහිදි ලබාදිමට පියවර ගත යුතු වේ.

ඒ අනුව ව්‍යවසායකත්ව පුහුණු වැඩසටහන් සංවිධානය කළ යුත්තේ ව්‍යාපාරික සංගම් සාමාජිකත්වය ලබා සිටින ව්‍යවසායකයින්ගේ පුහුණු අවශ්‍යතා නිවැරදිව හඳුනාගෙන සම්පූර්ණ කිරීම සඳහා වන අතර,එය ප්‍රජාමූල බැංකු මට්ටමින් හෝ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස මට්ටමින් අවශ්‍යතාවය මත සැලසුම් කළ හැකිය.

ඒ අනුව එක් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයකට රුපියල් 50,000.00ක මුදලක් දෙපාර්තමේන්තු ප්‍රතිපාදන යටතේ වෙන් කර ඇත.

2.1.4. සමෘද්ධි බොජුන්හල්වල ආහාර සැකසීමේ පුහුණු වැඩසටහන්(කාන්තා ව්‍යවසායකයින් ප්‍රවර්ධනය කිරීම) තුලින් බොජුන්හල ආරම්භ කිරීම

ප්‍රාදේශීය හා දිස්ත්‍රික් මට්ටමින් ආරම්භ කරනු ලබන සමෘද්ධි බොජුන්හල් තුල වස විසෙන් තොර දේශීය ආහාර සකස් කිරීමට අවශ්‍ය දැනුම, කුසලතාවය හා ආකල්ප සංවර්ධනය කර එම පවුල් ඒකකවල ආර්ථික හා සාමාජීය සංවර්ධනය ඇති කිරීමත් එමගින් තිරසාර ජීවනෝපාය මාර්ගයක් ලෙස ආහාර සැකසුම් කර්මාන්තයේ නියලෙන කාන්තා ව්‍යවසායිකාවන් සවිබල ගැන්විම ඉලක්ක කර මෙම වැඩසටහන් සැලසුම් කර ඇත. එකී පුහුණුවට පහත සඳහන් පරිදිපුහුණුලාභීන් සහභාගි කරවිමට සැලසුම් කර ඇත.

1. දැනටමත් සමෘද්ධි බොජුන්හල් ඉදිකිරිම් ආරම්භ කර ඇති කොට්ඨාසවල ව්‍යවසායිකාවන් ලෙස කටයුතු කිරීමට ඉදිරිපත්ව ඇති කාන්තාවන් ,
2. පසුගිය වසරේ පුහුණුව සඳහා ඉල්ලීම් කර පුහුණු අවස්ථාව නොලැබූ බොජුන්හල් ඉදිකර ඇති කොට්ඨාසවල ව්‍යවසායිකාවන් ,
3. ස්වයං රැකියාවක් ලෙස ක්ෂණික ආහාර සැකසිමට කැමැත්ත දක්වන හා ව්‍යවසායක ක්ෂේත්‍රයට ප්‍රවිශ්ට වීමට රුචිකත්වය දක්වන තරුණියන්,

ඒ සඳහා හඳුනාගත් අයගේ නාමලේඛනය ව්‍යවසායක සංවර්ධන අංශය වෙත ඉදිරිපත් කළ යුතු අතර පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම හා සම්බන්ධිකරණ කටයුතු ව්‍යවසායක සංවර්ධන අංශය මගින් සිදුකිරීමට නියමිතය.

2.2. ව්‍යවසායසංවර්ධනයට අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම

සුළු හා කුඩා පරිමාණ ව්‍යවසායකයින්ගේ ව්‍යාපෘති ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය කුඩා පරිමාණයේ ගෘහස්ථ ගබඩා ඉදිකිරීම, ජංගම අලෙවි රථ, ජංගම අලෙවි කුටි මෙන්ම නිෂ්පාදනවල තත්ත්වය, ගුණාත්මකභාවය, ප්‍රමිතිය වැඩිදියුණු කිරීම මෙන්ම අගය එකතු කිරීමේ නිෂ්පාදන සඳහා අවශ්‍ය යන්ත්‍රසූත්‍ර හා උපකරණ සැපයිම සඳහා දෙපාර්තමේන්තු ප්‍රතිපාදන ලබාදීමට මේ යටතේ හැකියාව ඇත.

එක් ව්‍යවසායකයකු සඳහා ඉහත අවශ්‍යතා වලින් එක් අවශ්‍යතාවක් වෙනුවෙන් ප්‍රතිපාදන ලබාදිය හැකි අතර දෙපාර්තමේන්තු දායකත්වය 50%ක් විය යුතු වේ.කෙසේ වෙතත් එම මුදල රු. 50,000.00ක උපරිමය නොඉක්මවිය යුතු අතරඑක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකට රු.200,000.00 ක් වනසේ ප්‍රතිපාදන වෙන් කර ඇත.ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ලැබෙන ඉල්ලීම් අනුව හා ව්‍යාපෘතිවල ස්වභාවය අනුව එම මුදල ගලපා ගත යුතුය. මෙහිදී ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සිටින "ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය" (NEDA) නිලධාරීන්ගේ සක්‍රීය සහායද ලබාගත යුතුය.

2.3 ව්‍යාපෘතිවල අලෙවි අවස්ථා පුළුල් කිරීම

දැනටමත් ආරම්භකර ඇති සුළු හා කුඩා පරිමාණ ව්‍යවසායකයින්ගේ නිෂ්පාදන සඳහා වෙළඳපල අවස්ථා පුළුල් කිරීම සඳහා පහත සඳහන් වැඩසටහන් තවදුරටත් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

2.3.1 සමෘද්ධි අලෙවි මධ්‍යස්ථාන

සමෘද්ධි වැඩසටහන තුලින් ගොඩනැගුනු කුඩා හා මධ්‍ය පරිමාණයේ සමෘද්ධි ව්‍යවසායකයින්ගේ නිෂ්පාදන සඳහා වෙළෙඳපළ පුළුල් කරදිමේ අරමුණ ඇතිව සෑම දිස්ත්‍රික්කයම සමෘද්ධි අලෙවි මධ්‍යස්ථානයක් ආරම්භ කිරීමට 2016 හා 2017 වසරවල උපදෙස් ලබා දෙන ලදි.

මෙම වසරේදී ද සමෘද්ධි අලෙවි මධ්‍යස්ථාන ආරම්භ කිරීමට නියමිත අතර ප්‍රමුඛතාව දෙනු ලබන්නේ ඉහත වසර වලදී ආරම්භ කරන ලද එහෙත් මෙතෙක් වැඩ අවසන් නොවූ ව්‍යාපෘති වල වැඩ අවසන් කිරීම වෙනුවෙනි.

එබැවින් පසුගිය වසර දෙක තුළ ආරම්භ කරන ලද ව්‍යාපෘති වල තවදුරටත් කළ යුතු වැඩ කොටස් වෙනුවෙන් සකස් කරන ලද වියදම් ඇස්තමේන්තු නොපමාව ව්‍යවසාය සංවර්ධන අංශය වෙත ඉදිරිපත් කොට අවශ්‍ය ප්‍රතිපාදන ඉල්ලුම් කළ යුතුය. මෙවැනි ව්‍යාපෘති කඩිනමින් වැඩ

අවසන් කොට මෙම වසරේදීවිවෘත කිරීමට අවශ්‍ය පියවර ගැනීම අදාල දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්ගේ වගකීම වේ.

එසේම **<u>අළුතින් ආරම්භ</u>** කිරීමට යෝජිත ව්‍යාපෘතියක් වෙනුවෙන් රුපියල් මිලියන 08 ක උපරිමයකට යටත්ව දෙපාර්තමේන්තු ප්‍රතිපාදන වෙන් කරනු ලැබේ. එලෙස ආරම්භ කිරීමට යෝජිත ව්‍යාපෘති වලට අදාලව සකස් කරන ලද ව්‍යාපෘති යෝජනා අතිරේක අධ්‍යක්ෂ ජනරාල්/ දිස්ත්‍රික් ලේකම්ගේ නිර්දේශයෙන් ව්‍යවසාය සංවර්ධන අංශය වෙත ඉදිරිපත් කොට අනුමැතිය ලබා ගත යුතුවේ.

පවත්නා ප්‍රතිපාදන සීමාවන් තුළ අනුමැතිය ලබා දිය හැක්කේ නව ව්‍යාපෘති සීමිත සංඛ්‍යාවක් සඳහා පමණක් බැවින් ලැබෙන ඉල්ලීම් ප්‍රමුඛතාවය මත සලකා බලනු ලැබේ.

2.3.2 සමෘද්ධි අලෙවි මධ්‍යස්ථාන/ බොජුන්හල් සඳහා ප්‍රාග්ධන උපකරණ සැපයිම හා ප්‍රචාරණය (අලෙවි මධ්‍යස්ථාන/ බොජුන්හල් 10)

සමෘද්ධි අලෙවි මධ්‍යස්ථාන ආශ්‍රිතව හා ප්‍රාදේශිය මට්ටමින් ආරම්භ කරනු ලබන සමෘද්ධි බොජුන්හල් සඳහා අවශ්‍ය වන ප්‍රාග්ධන උපකරණ සැපයිමට හා ප්‍රචාරන කටයුතු වෙනුවෙන් අවශ්‍ය ප්‍රතිපාදන මේ යටතේ සැපයිමට සැලසුම් කර ඇත.

එක් ව්‍යාපෘතියක් වෙනුවෙන් උපකරණ මිලදි ගැනිම හා ප්‍රචාරණය සඳහා ලබා දෙන දෙපාර්තමේන්තු ප්‍රතිපාදන උපරිම මුදල රුපියල් 750,000.00 ක් වන අතර අවශ්‍ය ප්‍රතිපාදන ලබා ගැනිම සඳහා ඉල්ලිම් කළ යුතුය.

2.3.3 සෞභාග්‍යා වෙළඳ ප්‍රදර්ශන සංවිධානය කිරීම

වෙළඳ ප්‍රදර්ශන සංවිධානය කිරිමේදී ඒ සඳහා සහභාගිවන ව්‍යාපාරිකයින් දැනටමත් මුහුණපාන,

- මූල්‍යමය / ප්‍රාග්ධන ගැටළු
- අලෙවි ගැටළු
- කළමණාකරන ගැටළු
- තාක්ෂණික ගැටළු

ආදිය පූර්වයෙන් හඳුනා ගැනීමට කටයුතු කළ යුතු අතර ඒ සඳහා විසඳුම් ලබාදිය හැකි රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සහාය සේවා ආයතන සමඟ හමුවක් වෙළඳ ප්‍රදර්ශනය කාලසිමාව තුලදී සංවිධානය කළ යුතුය. වෙළඳ ප්‍රදර්ශන/අලෙවි පොල සඳහා විශාල ප්‍රමාණයක් ව්‍යවසායකයින් සම්බන්ධ වන අතර ඔවුන්ගේ ගැටළු ප්‍රදර්ශනයට/අලෙවි පොලට කලින් හඳුනාගෙන එය එම

ප්‍රදර්ශනය /වෙළඳපල පැවැත්වෙන කාලය තුල විසඳා එම විසඳුම් ලබාදුන් ආකාරය සාක්ෂි සහිතව අප අංශයට ඉදිරිපත් කළ යුතුය.

2.4 විශේෂ වැඩසටහන්

ව්‍යවසාය සංවර්ධන වැඩසටහනේ වාර්ෂික ක්‍රියාත්මක සැලැස්මට ඇතුලත් නොවූ එහෙත් අත්‍යවශ්‍යව ඉටු කළයුතු හෝ කාලීන අවශ්‍යතාවයක් මත කළයුතු වැඩසටහන් හෝ යම් ව්‍යාපෘතියක් සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම මේ යටතේ සිදු කරනු ලැබේ. මේ සඳහා ලැබෙන ඉල්ලීම් සම්බන්ධයෙන් ප්‍රමුඛතාවය දී කටයුතු කිරීමට සිදුවනු ඇත.

2.5 ප්‍රගති සමාලෝචන රැස්වීම්

ව්‍යවසාය සංවර්ධන වැඩසටහනේ ප්‍රගති සමාලෝචන රැස්වීමක් සෑම මාස 03කට වරක් දිස්ත්‍රික් ව්‍යවසාය සංවර්ධන විෂයභාර කළමනාකරුවන්ගේ සහභාගීත්වයෙන් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේදි පැවැත්වීමට සැලසුම් කර ඇති අතර අදාල වාර්තා සමග විෂය කළමණාකරු සහභාගි විය යුතුය.

03. නව ව්‍යවසායකයින්14,021හඳුනා ගැනිම, පුහුණු කිරීම හා ව්‍යාපාර ආරම්භ කිරීම.

සමෘද්ධි පවුල්වල කරුණ තරුණියන් හා දෙමාපියන් අතරින් අළුතින් **කෘෂිකර්ම, සත්ත්ව පාලන හෝ ධිවර, කර්මාන්ත හා සේවා** යන ඕනෑම ක්ෂේත්‍රයකින් ව්‍යාපාරයක් ආරම්භ කිරීමට උනන්දුවක් දක්වන අය අතරින් ග්‍රාමසේවා වසමකින් එක් අයකු බැගින් හදුනා ගෙන නව ව්‍යාපාරයක් ආරම්භ කිරීමට පෙළඹවිම හා ඔවුන් සාර්ථක ව්‍යවසායකයින් බවට පත් කිරීමට කටයුතු කළ යුතුය.

සමෘද්ධි ප්‍රතිලාභී පවුල්වල පාසැල් හැරගිය වයස අවුරුදු 16 – 35 ත් අතර රැකියා විරහිත තරුණ තරුණියන් කෙරේ විශේෂ අවධානයක් යොමු කරමින් සුදුසු අය තෝරා ගැනීමට කටයුතු කළ යුතුය. එම තෝරා ගැනිමේදි සාම්ප්‍රදායක ස්වයං රැකියාවන්ගෙන් බැහැර වූ නිර්මාණශිලී හා පරිසර හිතකාමී නව නිපැයුම් තුලින් ව්‍යවසායකයෙකු ලෙස ව්‍යාපාරික ලෝකයට ප්‍රවිශ්ට වීමට කැමැත්තක් දක්වන තරුණ තරුණියන් තෝරා ගැනීම කෙරේ වැඩි අවධානයක් යොමු කිරීම අත්‍යාවශ්‍ය වේ.

මෙලෙස තෝරා ගනු ලබන්නන් ව්‍යවසායක සංගම් වලට හා සමෘද්ධි ප්‍රජාමූල බැංකු සංගම් සමඟ සම්බන්ධ කළ යුතුය. මෙම අයගේ පුහුණු අවශ්‍යතාහා අදාල මඟ පෙන්වීම ප්‍රාදේශීය පුහුණු කරුවන්ගෙන් හා ව්‍යවසායක උපදේශකයින් වෙතින් ලබා දීමට සැලසුම් කර ඇත.මෙම පුහුණු වැඩසටහන සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකට රු. 100,000.00 ක ප්‍රතිපාදන වෙන්කර ඇති අතර තෝරාගත් ව්‍යවසායකයන් සම්බන්ධ කර ගනිමින් පුහුණු වැඩමුළු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් පැවැත්විය යුතුය.

එසේම පුහුණුව අවසන් කරන ව්‍යවසායකයින්ට ව්‍යාපාර ආරම්භ කිරීමට අවශ්‍ය ප්‍රාග්ධන උපකරණ මිලදි ගැනිමට හා මූලික වියදම් සඳහා සමෘද්ධි ප්‍රජාමූල බැංකු සංගමයට සම්බන්ධ කර ප්‍රාග්ධන අවශ්‍යතා සපයා දිය යුතු වේ.එහිදී අදාල බැංකු කළමණාකරුවන් සෘජු මැදිහත්වීම හා නිර්දේශය මෙම ව්‍යවසයකයා කෙරෙහි තබාගත යුතුවේ. සමෘද්ධි බැංකුවේ "චක්‍රීය අරමුදල" මේ සඳහා විශේෂයෙන් යොදා ගත හැකිය.

<u>පොදු උපදෙස්</u>

01. ව්‍යාපෘති තෝරා ගැනීමේදී ප්‍රජාවට ගැලපෙන ආකාරයට මෙන්ම ව්‍යවසායකයාගේ ව්‍යාපාරයේ තිරසාර බව තහවුරු වන ආකාරයට ප්‍රතිලාභීන් තෝරා ගැනීම කළ යුතු අතර ඔහු /ඇය ප්‍රජාමූල සංවිධානයේ සාමාජිකයෙකු බවට තහවුරුවක් ලබාගත යුතුය.

02. ව්‍යාපෘති සඳහා වන සියළු මිලදී ගැනීම් හා අනෙකුත් සියළු කටයුතු රජයේ මුදල් රෙගුලාසි හා ප්‍රසම්පාදන ක්‍රියාවලීන්ට අනුකූලව සිදුකළ යුතු බව අවධාරණය කෙරෙන අතර අදාල ආයතන හා දෙපාර්තමේන්තු නිර්දේශිත මිල ගණන් සැලකිල්ලට ගෙන ගෙවීම් කිරීමටද වගබලා ගත යුතුය. අවශ්‍ය අවස්ථාවන්හිදී ප්‍රතිලාභීන් සමඟ ගිවිසුම් වලට එළඹීමෙන් පසුව මුදල් නිදහස් කිරීමට පියවර ගැනිම වඩාත් සුදුසු වේ.

03. ඉදිකිරීම් වලට අදාලව ආරම්භ කරනු ලබන ව්‍යාපෘති සියල්ල මෙම මුදල් වර්ෂය තුළ ඉදිකිරීම් අවසන් කළ යුතු අතර කිසිදු විටෙක ව්‍යාපෘති අඛණ්ඩ නොකළ යුතුය.

04. ව්‍යාපෘති අධීක්ෂණය, පසු විපරම් ක්‍රියාවලිය මෙන්ම ප්‍රගති සමාලෝචනයද, සමෘද්ධි ප්‍රජාමූල බැංකු සංගම් මට්ටමින් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් සිදුවිය යුතු අතර ඒ සඳහා සුදුසු ක්‍රමවේදයක් සකසා ගත යුතුය.

05. භාණ්ඩාගාර සෘජු ප්‍රතිපාදන යටතේ කේවල ව්‍යාපෘති සඳහා අනුමත කරන මුදල් නැවත අය කිරීමක් නොකෙරේ. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී එකී ව්‍යාපෘති සඳහා සත්‍ය වශයෙන්ම දරන

වියදමට අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා 0.5% ක් ද ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා 1.5%ක් ද වනසේ පරිපාලන වියදම් වෙන් කරනු ලැබේ.

06. ප්‍රාදේශීය මට්ටමෙන් හඳුනා ගන්නා ලද ව්‍යාපෘති යෝජනා ඇමුණුම් අංක 01 ආකෘතියට අනුව සකස් කොට ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශයෙන් දිස්ත්‍රික් ලේකම්/දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කොට අනුමැතිය ලබාගත යුතුය.

07. දිස්ත්‍රික් ලේකම්/දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ විසින් අනුමත කරන ලද ව්‍යාපෘති ලේඛනය සඳහා අවශ්‍ය වන අග්‍රිම ඇමුණුම 02 මගින් ව්‍යවසාය සංවර්ධන අංශය වෙත ඉදිරිපත් කොට අග්‍රිම ලබා ගත යුතුය.

08. සෑම මසකම අවසන් දිනට සකස් කරන ලද මාසික ප්‍රගති වාර්තාව ඇමුණුම් අංක 03 මගින් එළඹෙන මස 10 වන දිනට පෙර අධ්‍යක්ෂ (ව්‍යවසාය සංවර්ධන) වෙත ලැබීමට සැලැස්විය යුතුය.

09. ව්‍යවසාය සංවර්ධන වැඩසටහන යටතේ ප්‍රතිලාභී පවුල් 14,021ක් සවිබල ගැන්විය යුතුවේ. එබැවින් ඒ ඒ වැඩසටහන් සඳහා චක්‍ර ලේඛන උපදෙස් පරිදි නියමිත ප්‍රතිලාභීන් සංඛ්‍යාව තෝරා ගැනීම අනිවාර්ය වේ. එමෙන්ම දෙපාර්තමේන්තු ප්‍රතිපාදන වලට සීමා නොවී සමෘද්ධි ප්‍රජාමුල බැංකු සංගම් ණය වැඩසටහන් හා වෙනත් සහාය සේවා ආයතන මගින් කරනු ලබන පුහුණුවීම් හා පහසුකම් ලබාදීම තුළින්ද ප්‍රතිලාභීන් සවිබල ගැන්වීමට පියවර ගත යුතුය.

10. ව්‍යවසාය සංවර්ධනයට අවශ්‍ය යටිතල පහසුකම් සැලසීමේ වැඩසටහන යටතේ යම් ප්‍රතිලාභියෙකු සඳහා රු. 50,000/-ක දෙපාර්තමේන්තු දායකත්වය ප්‍රමාණවත් නොවන්නේ නම් 50% දෙපාර්තමේන්තු දායකත්වය රු. 75,000/- ක් දක්වා වැඩි කළ හැකි අතර ඒ සඳහා දිස්ත්‍රික් ලේකම්/අතිරේක අධ්‍යක්ෂ ජනරාල්ගේ විශේෂ අනුමැතියක් ලබාගත යුතුය.

11. ව්‍යාපෘතිවලට අදාල ප්‍රදර්ශන නාම පුවරු සමෘද්ධි ලාංඡනය සහිතව අනුමත වර්ණයන් යොදා සකස් කළ යුතුය.

ආචාර්ය සුනිල් ජයන්ත නවරත්න
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්

01. ලේකම්, සමාජ සවිබල ගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය -කා.දැ.ගැ.පි
02. අතිරේක ලේකම්(සංවර්ධන), සමාජ සවිබල ගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය -කා.දැ.ගැ.පි
03. සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් -අ.ක.ස

04. ප්‍රධාන ගණකාධිකාරී -අ.ක.ස

05. ප්‍රධාන අභ්‍යන්තර විගණක -අ.ක.ස

06. සියළුම අංශ ප්‍රධානීන් -අ.ක.ස